# ඡට්ඨමො පාඨො

# පිපාසා

තදා එකො සුවපොතකො පිපාසිතො තත්‍ථ තත්‍ථ පානීයං පරියෙසන්තො මහාරඤ්ඤෙ එකස්මිං පූතිපාදපෙ සට්ඨිරතනනරකාවාටෙ පානීයගන්ධං සායිත්‍වා ලොභෙන පාතුං ඔතිණ්ණො අතිපානෙන භාරො තත්‍ථෙ’ව පතිත්‍වා උග්ගන්තුං නාසක්ඛි. අථාපරෝ’පි සප්පො ච, මනුස්සො චාති ද්වෙ ජනා තත්‍ථෙ’ව පතිංසු. සප්පා නාම විවෙකං ලද්ධා’ව අත්තං විජහන්ති. තස්මායං අලද්ධා විවෙකත්තං උග්ගන්තුං නාසක්ඛි. අනාලම්බත්තා මනුස්සො’පි තෙ උග්ගන්තුං අසක්කොන්තා මරණභයභීතා අඤ්ඤමඤ්ඤමවිහෙඨෙන්තා තත්‍ථෙ’ව වසිංසු.

**(රසවාහිනී, ජම්බුදීපුප්පත්තිකථා)**

පද මාලාව

| | | | |
|---|---|---|---|
| **සුවපොතකො** | **(ස)** | - | ගිරා පැටවා |
| **පිපාසිත** | **(කි)** | - | පවසට පත් |
| **පානීයං** | **(කි)** | - | පැන්/ජලය |
| **පරියෙසන්තො** | **(කි)** | - | සොයනුයේ |
| **පූතිපාදපෙ** | **(ස)** | - | කුණු වූ ගසක |
| **සට්ඨිරතන** | **(ස)** | - | හැටරියන් |
| **නරකාවාට** | **(ස)** | - | නරාවළ |
| **සායිත්‍වා** | **(පූ.ක්‍රි)** | - | රසවිඳ |
| **උග්ගන්තුං** | **(තු)** | - | උඩට එන්නට |
| **ද්වෙජනා** | **(නා)** | - | දෙදෙනෙක් |
| **ලද්ධාව** | **(සං)** | - | ලැබ ම |
| **විජහති** | **(ක්‍රි)** | - | අතහරී |
| **අනාලම්බත්තා** | **(ස)** | - | එල්බගැනීමක් නොමැති බැවින් |

**අභ්‍යාස**

1. ‘පිපාසා’ ඡේදය සිංහලට නගන්න.
2. ඡේදය ආශ්‍රයෙන් පහත ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කෙ ජලං පරියෙසන්තා නරකාවාටෙ පතිංසු?
ii. කස්මා සුවපොතකො උග්ගන්තුං නාසක්ඛි?
iii. සප්පා කථං අත්තං විජහන්ති?
iv. මහාරඤ්ඤෙ නරකාවාටෙ කිං අහවි?
v. මරණභයභීතා තෙ කථං වසිංසු?

## ආඛ්‍යාත විභක්ති II

වාක්‍යයක් සම්පූර්ණ වීමටත් පූර්ණ අර්ථයක් ලබා ගැනීමටත් ආඛ්‍යාත වැදගත් වන බව ඉහත පාඩම්වල දී ඔබ උගෙන ඇත. කාලත්‍රයට අයත් ආඛ්‍යාත මීට පෙර වරනගා අර්ථ ගන්වා තිබෙන හෙයින් මෙම පාඩමේ දී **පඤ්චමී** හා **සත්තමී** ආඛ්‍යාත විභක්තිවල වරනැගීම් සිදු වන්නේ කෙසේ දැයි බලමු.

### පඤ්චමී ආඛ්‍යාතය

අණකිරීමක් හෝ ආශීර්වාද කිරීමක් හෝ පැවසීමට පඤ්චමී ආඛ්‍යාත විභක්තිය යෙදේ. **(ආණත්‍යාසිට්ඨෙනුත්තකාලෙ පඤ්චමී)**

**අණකිරීම:-** **සම්ම, ඉධාගච්ඡ** (මිත්‍රය, මෙහි එන්න)
**තුම්හෙ, ඉමං සප්පං න මාරෙථ** (තෙපි මේ සර්පයා නො මරවු)

**ආශීර්වාද කිරීම:-** **හොතු තෙ ජයමඞ්ගලං** (ඔබට ජය මංගල්‍යයක් වේවා!)
**රක්ඛන්තු සබ්බදෙවතා** (සියලු දෙවියෝ රකිත්වා!)

**තු, අන්තු, හි, ථ, මි, ම** යන ප්‍රත්‍යය පරස්සපදයට ද **තං, අන්තං, ස්සු, ව්හො, එ, ආමසෙ** යන ප්‍රත්‍යය අත්තනොපදයට ද අයත් වේ.

විධානයක් කිරීමේ දී මධ්‍යම පුරුෂ ඒකවචන 'හි' ප්‍රත්‍යය ලොප් වී **ගච්ඡ, තිට්ඨ, ආහර** යනාදි වශයෙන් ද යෙදේ. ඇතැම් විට උක්තපදය ඒකවචන වුවත් ආඛ්‍යාතපදය බහුවචනයෙන් ද යෙදුණු තැන් දක්නට ලැබේ.

**පඤ්චමී පරස්සපද**

| පුරුෂය | ඒකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ආඛ්‍යාතය | ප්‍රත්‍යය | ආඛ්‍යාතය |
| **පඨමපුරිස** | තු | ජයතු | අන්තු | ජයන්තු |
| **මජ්ඣිමපුරිස** | හි | ජය, ජයාහි | ථ | ජයථ |
| **උත්තමපුරිස** | මි | ජයාමි | ම | ජයාම |

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමපුරිස | ජය වේවා | ජය වෙත්වා |
| මජ්ඣිමපුරිස | ජය වෙහිවා | ජය වෙහුවා |
| උත්තමපුරිස | ජය වෙම්වා | ජය වෙමුවා |

### පඤ්චමී අත්තනොපද

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
| පඨමපුරිස | සො | තං | ජයතං | තෙ | අන්තං | ජයන්තං |
| මජ්ඣිමපුරිස | ත්වං | ස්සු | ජයස්සු | තුම්හෙ | ව්හො | ජයව්හො |
| උත්තමපුරිස | අහං | ඒ | ජයෙ | මයං | ආමසෙ | ජයාමසෙ |

පහත දැක්වෙන වගු අධ්‍යයනය කරන්න.

### පඤ්චමී පරස්සපද

| පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|
| ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන |
| හවතු | හවන්තු | හව, හවාහි | හවථ | හවාමි | හවාම |
| රක්ඛතු | රක්ඛන්තු | රක්ඛ, රක්ඛාහි | රක්ඛථ | රක්ඛාමි | රක්ඛාම |
| සුණාතු | සුණන්තු | සුණ, සුණාහි | සුණාථ | සුණාමි | සුණාම |

### පඤ්චමී අත්තනොපද

| පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|
| ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන |
| හවතං | හවන්තං | හවස්සු | හවව්හො | හවෙ | හවාමසෙ |
| රක්ඛතං | රක්ඛන්තං | රක්ඛස්සු | රක්ඛව්හො | රක්ඛෙ | රක්ඛාමසෙ |
| සුණතං | සුණන්තං | සුණස්සු | සුණව්හො | සුණෙ | සුණාමසෙ |

**සත්තමී ආඛ්‍යාතය**

**අනුමති** හා **පරිකල්ප** යන අර්ථයන්හි යෙදෙන සත්තමී ආඛ්‍යාත විභක්තිය අනාගත කාලයට අයත් ය. යමක් කරනු කැමැත්තාට එය කිරීම මැනවැ'යි අනුමත කිරීම අනුමති අර්ථය යි. කුමක් කළයුතු දැයි කල්පනා කිරීමත් එහි නියමයක් නොමැති බවත් පරිකල්පාර්ථය යි. **(අනුමති පරිකප්පත්ථෙසු සත්තමී)**

**අනුමති අර්ථයඃ-**

**සාධු ත්වං සබ්බදා සායං බුද්ධං පූජෙය්‍යාසි.**
(ඔබ සැමදා සවස බුදුන් පුදන්නේ නම් මැනවි)

**පරිකල්පාර්ථයඃ-**

**යනූන අහං මාතාපිතරෙ පස්සෙය්‍යං.**
(ඉදින් මම මව්පියන් දකින්නේ නම් මැනවි)

සත්තමී ආඛ්‍යාතය යෙදුණු පහත වාක්‍ය දෙස බලන්න. සත්තමී ආඛ්‍යාතය යෙදෙන විට **සචෙ, චෙ, යදි, යනූන** වැනි නිපාත පද මුලින් යෙදීම සාමාන්‍ය ලක්ෂණයකි.

- සචෙ හි සො භික්ඛවෙ භික්ඛු චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන **ඵරෙය්‍ය**, න හි සො භික්ඛවෙ භික්ඛු අහිනා දට්ඨො කාලං **කරෙය්‍ය.**
- මමේ'ව තස්මිං සමයෙ ධජග්ගං **උල්ලොකෙය්‍යාථ.**
- නො චෙ මං **අනුස්සරෙය්‍යාථ** අථ ධම්මං **අනුස්සරෙය්‍යාථ.**
- නො චෙ මෙ ධජග්ගං **උල්ලොකෙය්‍යාථ** අථ වරුණස්ස දෙවරාජස්ස. ධජග්ගං **උල්ලොකෙය්‍යාථ.**
- **ලභෙය්‍යං** අහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං **ලභෙය්‍යං** උපසම්පදං.

**එය්‍ය, එය්‍යුං, එය්‍යාසි, එය්‍යාථ, එය්‍යාමි, එය්‍යාම** යන ප්‍රත්‍යය සත්තමී පරස්සපදයේත් **එථ, එරං, එථො, එය්‍යවෙහො, එය්‍යං, එය්‍යාමෙහ** යන ප්‍රත්‍යය අත්තනොපදයේත් යෙදේ.

**සත්තමී පරස්සපද**

| පුරුෂය | ඒකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ආඛ්‍යාතය | ප්‍රත්‍යය | ආඛ්‍යාතය |
| **පඨමපුරිස** | එය්‍ය | පචෙය්‍ය | එය්‍යුං | පචෙය්‍යුං |
| **මජ්ඣිමපුරිස** | එ්‍යාසි | පචෙය්‍යාසි | එය්‍යාථ | පචෙය්‍යාථ |
| **උත්තමපුරිස** | එය්‍යාමි | පචෙය්‍යාමි | එය්‍යාම | පචෙය්‍යාමි |

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමපුරිස | පිසන්නේය | පිසන්නෝය |
| මජ්ඣිමපුරිස | පිසන්නෙහි | පිසන්නෙහු |
| උත්තමපුරිස | පිසන්නෙමි | පිසන්නෙමු |

**සත්තමී අත්තනොපද**

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
| පඨමපුරිස | සො | එථ | පචෙථ | තෙ | එරං | පචෙරං |
| මජ්ඣිමපුරිස | ත්වං | එථො | පචෙථො | තුම්හෙ | එය්‍යාව්හො | පචෙය්‍යාව්හො |
| උත්තමපුරිස | අහං | එය්‍යං | පචෙය්‍යං | මයං | එය්‍යාම්හෙ | පචෙය්‍යාම්හෙ |

**අභ්‍යාස**

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පඤ්චමී ආඛ්‍යාතය හැඳින්වෙන බාලාවතාර පාඨය දක්වා තේරුම ද ලියන්න.
ii. සත්තමී ආඛ්‍යාතය යෙදෙන අර්ථ දෙක ලියා උදාහරණය බැගින් ලියන්න.
iii. පඤ්චමී ආඛ්‍යාත පද යෙදුණු පාලි පාඨ 05ක් සොයා ලියන්න.
iv. සත්තමී ආඛ්‍යාත පද යෙදුණු පාලි පාඨ 05ක් සොයා ලියන්න.
v. පඤ්චමී හා සත්තමී ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය මාලා වගුගත කර දක්වන්න.
vi. √ඡිද (ඡින්දති) √ගමු (ගච්ඡති) යන ධාතු පඤ්චමී හා සත්තමී ආඛ්‍යාතවල වරනගා වගුගත කර දක්වන්න.

2. පහත දැක්වෙන ආඛ්‍යාත පදවල පඤ්චමී හා සත්තමී ආඛ්‍යාත පරස්සපද ප්‍රථම පුරුෂ ඒකවචන රූප ලියා දක්වන්න.

| ආඛ්‍යාත පදය | පඤ්චමී | සත්තමී | ආඛ්‍යාත පදය | පඤ්චමී | සත්තමී |
|---|---|---|---|---|---|
| ඛාදාමි | | | චරසි | | |
| ධාවිංසු | | | යාචථ | | |
| හරති | | | භණාමි | | |
| දදි | | | අභාසි | | |
| ගණ්හන්ති | | | ලභති | | |

3. පහත දැක්වෙන වාක්‍ය සිංහලට නගන්න.

i. සබ්බෙ පාණිනො ච රුක්ඛලතායො ච ජලෙන ජීවන්ති.
ii. අසුද්ධජලපරිභොගෙන නානා රොගා උප්පජ්ජන්ති.
iii. මයං අසුද්ධජලං කථං ජානෙම?
iv. දෙවා සීහලදීපං රක්ඛන්තු.
v. අහං සතතං තුම්හෙ රක්ඛාමි.

4. පහත දැක්වෙන වාක්‍ය පාලියට නගන්න.

i. පින්වත්හු මගේ වචනය අසත්වා!
ii. වක්කලී, ඔබ මෙතැනින් යන්න.
iii. සත්පුරුෂයන්ගේ ඇසුර වේවා!
iv. ඔබ පිරිවෙණට යන්නේ නම් මැනවි.
v. ඉදින් ඔබ යන්නෙහි නම් මම ද යමි.